සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 8 ශ්‍රේණිය
## නාට්‍ය හා රංග කලාව

**නම/විභාග අංකය :-- ....................................................................................** **කාලය : පැය 02යි.**

---

### I කොටස

---

● **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

1. නාට්‍යයක තිබිය යුතු අත්‍යවශ්‍ය අංගයකි.

    1. ගැටුම. 2. ගීත. 3. හාස්‍යය. 4. නැටුම.

2. රූපණය සිදු කරනුයේ,

    1. පෙළ මතක් කරන්නන් ය. 2. රංගන ශිල්පීන් ය.
    3. වේදිකා සහායකයින් ය. 4. ප්‍රේක්ෂකයන් ය.

3. නාට්‍යයට සම්බන්ධ පුද්ගලයෙක් නොවන්නේ,

    1. පෙළ රචකයා 2. අධ්‍යක්ෂවරයා
    3. සංගීත අධ්‍යක්ෂවරයා 4. කැමරාකරු

4. ලංකාවේ ළමා නාට්‍ය අධ්‍යක්ෂවරයකු වන්නේ,

    1. පාලිත ලොකුපෝතාගම 2. එදිරිවීර සරච්චන්ද්‍ර
    3. ගුණසේන ගලප්පත්ති 4. සෝමරත්න දිසානායක

5. ආහාර්ය අභිනයට අයත් නොවන්නේ,

    1. සංගීතය 2. වේදිකා පසුතල 3. අංග චලන 4. අංග රචනා

● **ප්‍රශ්න අංක 6 සිට 10 තෙක් හරි නම් √ ලකුණ ද වැරදි නම් x ලකුණ ද ඉදිරියෙන් යොදන්න.**

6. නාට්‍ය යනු සාමූහික කලා නිර්මාණයකි. ( )

7. තේමාව යනු නාට්‍ය පෙළින් ප්‍රකාශ වන අදහසයි. ( )

8. පරිකල්පනය මඟින් නිර්මාණාත්මක චින්තනය වර්ධනය නොවේ. ( )

9. සංවාද අයත් වන්නේ ආංගික අභිනයට ය. ( )

10. ජීවන ගැටලු විසඳා ගැනීමට වේදිකා නාට්‍ය උපකාරී නොවේ. ( )

- **ප්‍රශ්න අංක 11-15 තෙක් කෙටි පිළිතුරු සපයන්න.**

11. ආගමික කතා පදනම් කරගෙන රචනා කළ නාට්‍යයක් නම් කරන්න.

.............................................................................................................................................

12. නාට්‍ය පිටපතක ඇතුළත් අංගයක් නම් කරන්න.

.............................................................................................................................................

13. ආංගික අභිනයේදී ශරීරය ප්‍රභේද වන කොටස් නම් කරන්න.

.............................................................................................................................................

14. නළුවරණය යනු,

.............................................................................................................................................

15. නාට්‍ය නරඹන්නා හඳුන්වන නම,

.............................................................................................................................................

- **ප්‍රශ්න අංක 16 - 20 තෙක් නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.**

| | | |
|---|---|---|
| 16. | හේල හෙලෙයි හෙලෙයි ලාම් | නාට්‍ය ගීත |
| 17. | පහතරට ශාන්තිකර්මයකි. | බුද්ධ ගජ්ජය |
| 18. | කටහඬ අභ්‍යාස | තොප්පි වෙළෙන්දා |
| 19. | දීකිරි දීකිරි ගෙනාව දීකිරි | ධීවර ගීතය |
| 20. | ළමා නාට්‍යයකි | සන්නි යකුම |

(ල. 2 x 20 = 40)

## II කොටස

● **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න 02 ක් ඇතුළුව ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.**

---

01. පහත සංවාද ඛණ්ඩ ඇසුරින් පිළිතුරු සපයන්න. (වලහා නින්දෙන් අවදි වූවා සේ.)

| | |
|---|---|
| වලහා | හරි හරි හොඳට ගායනා කරා |
| | කොච්චර හොඳට ගායනා කළා ද කියනවා නම් මට නින්ද යන්න ආවා. |
| මාෂා | වලස් රාලහාමි ඉතිං මට ගෙදර යන්න පාර පෙන්නනව ද? |
| වලහා | මොන කරදරයක් ද? දූන් ඉතිං මේක තමයි ඔයාගෙ ගෙදර |

1. ඉහත සංවාද ඛණ්ඩය අයත් නාට්‍යයේ නම කුමක් ද?
2. මෙම නාට්‍යය නිර්මාණය කළේ කවුරුන් ද?
3. මෙහි සඳහන් රංග විධානයක් ලියන්න.
4. මෙහි වලහා ''දූන් ඉතිං මේක තමයි ඔයාගෙ ගෙදර'' යනුවෙන් පවසන්නේ කාගේ ගෙදර ද?
5. මෙම නාට්‍යයේ එන ඔබ කැමති චරිතයක් පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න.

(ල. 4 x 5 = 20)

02. 1. රංග අභ්‍යාස යනු කුමක් ද? (ල.4)

2. රංග අභ්‍යාස 2 ක් නම් කරන්න. (ල.6)

3. එක් රංග අභ්‍යාසයක් ඔබ පන්ති කාමරය තුළදී සිදු කළ අයුරු විස්තර කරන්න. (ල.10)

03. 1. නාට්‍යෝචිත අවස්ථාවක් යනු කුමක් ද? (ල.4)

2. නාට්‍යෝචිත අවස්ථාවක තිබිය යුතු ලක්ෂණ 2 ක් ලියන්න. (ල.6)

3. ඔබ දන්නා නාට්‍යාකෘතියක තිබෙන නාට්‍යෝචිත අවස්ථාවක් ලියා දක්වන්න. (ල.10)

04. 1. වේශභූෂණය යන්න හඳුන්වන්න. (ල.4)

2. වේෂභූෂණ නිර්මාණයේදී සැලකිලිමත් විය යුතු කරුණු 2 ක් නම් කරන්න. (ල.6)

3. ඔබ කැමති චරිතයක් තෝරාගෙන ඊට උචිත වේෂභූෂණ ඇඳ දක්වන්න. (ල.10)

05. 1. පහත තේමාවන් අතුරින් එකක් තෝරාගෙන ඊට උචිත කතාවක් ලියන්න.

1. වෛරයෙන් වෛරය නොසන්සිඳේ

2. උත්සාහවන්තයා ජය ගනී.

3. පනින්න පෙර සිතා බලමු

4. ඉවසීමෙන් සැනසීම ලැබේ.

තේමාවට උචිත වීම.

නිර්මාණාත්මකව කතාව ගෙතීම. (ල.20)